SLGURU.LK

ශාන්ත පීතර විද්‍යාලය

Virtue and Truth

වර්ෂ අවසාන (පළමු වාරය) -2022

07 ශ්‍රේණිය

නර්තනය

පැය 02 යි

වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

01. ඇසල මාසයේ පවත්වනු ලබන සංස්කෘතික වටිනාකමින් යුත් පෙරහැරකි,
(i) මහනුවර දළඳා පෙරහැර (ii) මිහිඳු පෙරහැර
(iii) කඨින පෙරහැර (iv) සංඝමිත්තා පෙරහැර

02. ගාල්ල, මාතර, කළුතර ආදී ප්‍රදේශවල ප්‍රචලිත පවතින නර්තන සම්ප්‍රදාය වනුයේ,
(i) උඩරට නැටුම් (ii) පහතරට නැටුම්
(iii) භරත නැටුම් (iv) සබරගමු නැටුම්

03. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ,
(i) යක් බෙරය (ii) රුහුණු බෙරය (iii) බුම්මැඩිය (iv) දවුල

04. වන්නමක මාත්‍රා නැටීමෙන් පසුව කරනු ඊළඟ අංගය වනුයේ,
(i) අඩව්ව (ii) තානම (iii) කස්තිරම (iv) සීරුමාරුව

05. මාත්‍රා 2 + 3 තාලයට අයත් වන්නමකි,
(i) හනුමා (ii) තුරඟා (iii) සිංහජ (iv) වෛරොඩි

06. විතතාතත වර්ගයට අයත් වාද්‍ය භාණ්ඩයකි,
(i) ගැට බෙරය (ii) බුම්මැඩිය (iii) රබාන (iv) දවුල

07. මුස්ලිම් ජාතිකයින් විසින් සමරනු ලබන උත්සවයකි,
(i) තෛපොංගල් (ii) නත්තල් (iii) රාමසාන් (iv) වෙසක්

08. ප්‍රස්තාරකරණයේදී යෙදිය යුතු තාල සංඥා දෙක වන්නේ,
(i) + | − (ii) ∧ / + (iii) ∧ / ∧ (iv) ∧ / /

09 රත්නපුර ප්‍රදේශයේ වඩාත් ප්‍රචලිතව පවතින නර්තන සම්ප්‍රදාය වන්නේ,
(i) පහතරට නැටුම් (ii) සබරගමු නැටුම් (iii) උඩරට නැටුම් (iv) ද්‍රවිඩ ජන නැටුම්

10. පිරිමි ළමුන් සඳහා වඩාත් උචිත නර්තනයකි,
(i) කළ නැටුම් (ii) ලී කෙළි නැටුම් (iii) කුළු නැටුම් (iv) ගොයම් නැටුම්

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

11. "දඟර අඩිය " යනු,

(i) 5 වන පා සරඹයයි (ii) 7 වන පා සරඹයයි

(iii) 6 වන පාසරඹයයි (iv) 5 වන ගොඩ සරඹයයි

12. සන්නිවේදන කාර්ය සඳහා යොදාගත් වාද්‍ය භාණ්ඩයකි,

(i) දිග් බෙරය (ii) දවුල

(ii) සෝෂකය (iv) උඩැක්කිය

13. ලය ප්‍රභේද ,

(i) 3 කි (ii) 6 කි (iii) 4 කි (iv) 18 කි

14. දඬු බෙරය,

(i) සාම්ප්‍රදායික භාණ්ඩයකි (ii) ආතත වාද්‍ය භාණ්ඩයකි

(iii) පහතරට වාද්‍ය භාණ්ඩයකි (iv) විකල්ප වාද්‍ය භාණ්ඩයකි

15. "දොං ජිංත ගත දොංත" යන බෙර පදයට අයත් තාල රූපය වන්නේ,

(i) මාත්‍රා 2 + 3 (ii) මාත්‍රා 3 + 3 (iii) මාත්‍රා 2 + 4 (iv) මාත්‍රා 2 + 2

(ලකුණු 2 x 15 = 30)

<u>හිස්තැනට සුදුසු පදය යොදා හිස්තැන් පුරවන්න.</u>

16. මාත්‍රා 3 + 3 හඳුන්වන්නේ ..... ලෙසය.

17. සියලු පා සරඹ නටා අවසානයේ ..... පදය නටනු ලැබේ.

18. ගැට බෙරය වාදනය කරනු ලබන්නේ ..... නර්තන සම්ප්‍රදායට ය.

19. තෙයි කිට තෙයිතාම් යනු ..... පා සරඹ පදයයි.

20. උඩරට නර්තන සම්ප්‍රදායේ ශිල්පීය ප්‍රාගුන්‍යය එළි දක්වන අවස්ථාව ..... ලෙස හැඳින්වේ.

(ලකුණු 2 x 5 = 10)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

පහත දී ඇති වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

21. උඩරට නර්තනයේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ වෙස් ඇඳුම් කට්ටලයකි ( )
22. දවුලේ දිග ප්‍රමාණය අඟල් 15 කි ( )
23. ගැමි නැටුම්වල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ සංකීර්ණ පද නර්තනයකි ( )
24. තාලය තැබීම සඳහා ගනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුලයි ( )
25. නර්තනය ශරීර නිරෝගීතාව ඇති කරයි ( )

(ලකුණු 2 x 5 = 10)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

II පත්‍රය

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. (i) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහි කල එළි අවස්ථා හඳුන්වන ආකාර ලියන්න

(ii) උඩරට නර්තන සම්ප්‍රදායේදී එම අවස්ථාවේ සිදු කරන චාරිත්‍ර 2 ක් ලියන්න

02. (i) දෙතිතේ ප්‍රභේද නම් කරන්න

(ii) ඔබ දන්නා එක් බෙර පදයක් ප්‍රස්තාර කරන්න

03. (i) තුරඟා වන්නමට අයත් කවියක් ලියන්න

(ii) එම වන්නම අයත් අඩව්ව ලියන්න

(ලකුණු 10 x 3 = 30)

ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 20 කි.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“Education is the passport to the future, for tomorrow belongs to those who prepare for it today.” — Malcolm X



Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only